# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 2043 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 29/07/2024 පැය 1030

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ</u>**

**01. 2024.07.28 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 297 | 160 | තඹ දඟර 01<br>යකඩ බැරල් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර**

2024.07.28 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් රාගම පොලිස් වසමේ බටුවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 51 මිලි ග්‍රෑම් 540 ක්, එම ජාවාරමෙන් උපයා ගන්නා බවට සැකකරන මුදල් 73,700/- ක් හා විද්‍යුත් තරාදි 01 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වූ බෙලිගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** රාගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. බලපත්‍රයක් නොමැතිව හිංසාකාරී ලෙස කැබ් රථයකින් ගවයින් ප්‍රවාහනය කල සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වව්නියාව කඳවුර**

2024.07.28 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වව්නියාව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වව්නියාව පොලිස් වසමේ කි.මී 06 කණුව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව හිංසාකාරී ලෙස කැබ් රථයකින් ගවයින් 14 දෙනෙකු ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන වව්නියාව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 20, 44 හා 46 වයස් වල පසුවන කහටගස්දිගිලිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. වව්නියාව** පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර**

2024.07.28 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඔක්කම්පිටිය පොලිස් වසමේ බුරුතගොල්ල ප්‍රදේශයේ වැටලීමක් සිදු කර ගංජා කිලෝ 01 ග්‍රෑම් 40 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඔක්කම්පිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 31 **ක් වූ ඔක්කම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ඔක්කම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**